ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

**<u>රුපියල් සිට රුපියල්: ඉන්දියා - ශ්‍රී ලංකා වාණිජ කොරිඩෝව ශක්තිමත් කිරීම යන මැයෙන් වටමේස සාකච්ඡාවක් කොළඹ දී පැවැත්වේ</u>**

ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් "රුපියල් සිට රුපියල්: ඉන්දියා - ශ්‍රී ලංකා වාණිජ කොරිඩෝව ශක්තිමත් කිරීම" යන මැයෙන් සංවිධානය කරන ලද වටමේස සාකච්ඡාවක් 2026 ජූනි 15 වන දින පැවැත්විණ. රාජ්‍ය ආයතනවල ජ්‍යෙෂ්ඨ නියෝජිතයන්, බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රයේ ආයතන, කර්මාන්තයේ නායකයන්, ආනයනකරුවන්, අපනයනකරුවන් සහ දෙරටෙහිම ව්‍යාපාර ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් රැසක් දේශීය මුදල් ඒකක භාවිතය ඉහළ නැංවීම හරහා ඉන්දියා - ශ්‍රී ලංකා ආර්ථික සහ වාණිජ නියැලීම් ගැඹුරු කිරීම සඳහා පවතින අවස්ථාවන් සාකච්ඡා කිරීම සඳහා මෙම වැඩසටහනට සහභාගී වූහ.

2. ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා පිළිගැනීමේ කතාව සිදු කළ අතර එහිදී එතුමා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික හවුල්කාරිත්වය වර්ධනය වන බව පෙන්වා දුන්නේය. එතුමා ද්විපාර්ශ්වික වෙළෙඳාම සහ ආයෝජන සහ මූල්‍ය සම්බන්ධකතාවය සඳහා පහසුකම් සැලසීමෙහිලා දේශීය මුදල් ඒකක පියවීමේ යාන්ත්‍රණවල වැදගත්කම ද අවධාරණය කළේය. ප්‍රධාන සමාරම්භක දේශනය ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ආචාර්ය පි. නන්දලාල් වීරසිංහ මැතිතුමා විසින් සිදු කරන ලදි. එහිදී එතුමා ඉන්දියානු රුපියල්-ශ්‍රී ලංකා රුපියල් ගනුදෙනු සඳහා වන මූල්‍ය රාමුව ශක්තිමත් කිරීම සඳහා මෑතක දී ගන්නා ලද ප්‍රතිපත්තිමය පියවර පෙන්වා දුන් අතර දෙරට අතර වෙළෙඳ සහ ආයෝජන සබඳතා ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළේය.

3. ඉන්දියානු රාජ්‍ය බැංකුව සහ ඉන්දියානු බැංකුව විසින් ඉදිරිපත් කිරීම් සිදු කළ අතර එහිදී ඉන්දියානු රුපියල්-ශ්‍රී ලංකා රුපියල් වෙළෙඳ පියවීම්වල මෙහෙයුම් පැතිකඩවල්, දැනට පවත්නා බැංකු විසඳුම් සහ ඉන්දියානු රුපියල්වලින් නාමනය කරන ලද ණය ශ්‍රී ලංකාවේ අවසරලත් නියෝජිත බැංකු හරහා ලබා දීමට අනුමැතිය ලබා දෙන මෑතකාලීන ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදි.

4. කොමර්ෂල් බැංකුව, සලොන් බැංකුව, ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව, AMW, DHT සිමන්ට්, ලංකා ස්පින් පෞද්ගලික සමාගම, නිත්‍යා පේපර් ඇන්ඩ් බෝර්ඩ්ස් ලංකා පෞද්ගලික සමාගම ඇතුළු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ බැංකු සහ සමාගම්වල ඉහළ පෙළේ නියෝජිතයන් ඇතුළු ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් විසින් පවත්වන ලද විශේෂ සාකච්ඡාවක් ද පැවැත්විණ.

5. මෙහිදී එම නියෝජිතයන් විසින් වෙළෙඳ සහ ආයෝජන ගනුදෙනුවලදී දේශීය මුදල් ඒකක භාවිතා කිරීමේ ප්‍රායෝගික අත්දැකීම්, ප්‍රතිලාභ, අභියෝග සහ අවස්ථාවන් බෙදා හදා ගත් අතර ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර වාණිජ කොරිඩෝව වඩා ශක්තිමත් කළ හැකි ආකාර ගවේෂණය කරන ලදී.

6. වටමේස සාකච්ඡාව තුළින් ඉන්දියානු රුපියල්-ශ්‍රී ලංකා රුපියල් පියවීමේ යාන්ත්‍රණය සඳහා වර්ධනය වෙමින් පවතින පිළිගැනීම සහ දේශ සීමාව හරහා වඩා සුමට ලෙස ගනුදෙනු කිරීම, ද්‍රවශීලතා කළමනාකරණය වැඩිදියුණු කිරීම, ගනුදෙනු පිරිවැය අඩු කිරීම සහ ද්විපාර්ශ්වික වෙළෙඳාමේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම යනාදිය සඳහා එහි පවතින විභවතාවය අවධාරණය කරන ලදී. දේශීය මුදල් ඒකක පියවීම්වල පූර්ණ විභවතාවය ළඟා කර ගැනීම සඳහා මේ සම්බන්ධයෙන් අඛණ්ඩව දැනුවත් කිරීම, වඩා ශක්තිමත් බැංකු සබඳතා සහ පෞද්ගලික ක්ෂේත්‍රයේ වඩා ඉහළ සහභාගිත්වයක් ඇති කිරීමේ අවශ්‍යතාවය ද සහභාගීවන්නන් විසින් අවධාරණය කරන ලදී.

***

**කොළඹ**

***2026* ජූනි *15***